// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2038/38 - 2017 සැප්තැම්බර් මස 28 වැනි බ්‍රහස්පතින්දා - 2017.09.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### මධ්‍යම පළාතේ පළාත් සභාව

මධ්‍යම පළාතේ පළාත් සභාවේ වර්ෂ 2000 අංක 01 දරන මගී ප්‍රවාහන සේවා අධිකාරි ප්‍රඥප්තිය යටතේ කරනු ලබන පත් කිරීම

මධ්‍යම පළාතේ, පළාත් සභාවේ මාර්ග සංවර්ධන, ප්‍රවාහන, විදුලිබල හා බලශක්ති සහ නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය එදිරිවීර වීරවර්ධන වන මම මධ්‍යම පළාත් සභාවේ 2000 අංක 01 දරන මධ්‍යම පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරි ප්‍රඥප්තියේ අංක 6(අ) 6(ඉ)(1) හා 7 (අ) වගන්ති ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව පහත නම සඳහන් අය ඔහුගේ නම ඉදිරියෙන් දැක්වෙන දින සිට බලපැවැත්වෙන පරිදි මධ්‍යම පළාත් සභාවේ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික/සභාපති ලෙස පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරමි.

එදිරිවීර වීරවර්ධන,
මාර්ග සංවර්ධන, ප්‍රවාහන, විදුලිබල හා
බලශක්ති සහ නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය,
මධ්‍යම පළාත.

2017 සැප්තැම්බර් මස 25 වැනි දින.

| *නම* | *ලිපිනය* | *තනතුර* | *ක්‍රියාත්මක දිනය* |
|---|---|---|---|
| චන්දන කුමාර මැන්දිස් | අංක 103/1, මැදගොඩ, පූජාපිටිය. | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික/සභාපති | 2017.09.25 |

10-383/1

**මධ්‍යම පළාතේ පළාත් සභාව**

මධ්‍යම පළාතේ පළාත් සභාවේ වර්ෂ 2000 අංක 01 දරන මගී ප්‍රවාහන සේවා අධිකාරි ප්‍රඥප්තිය

**පත්කළ සාමාජිකයන් ඉවත් කිරීම**

මධ්‍යම පළාතේ, පළාත් සභාවේ මාර්ග සංවර්ධන, ප්‍රවාහන, විදුලිබල හා බලශක්ති සහ නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය එදිරිවීර වීරවර්ධන වන මම මධ්‍යම පළාත් සභාවේ 2000 අංක 01 දරන මධ්‍යම පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරි ප්‍රඥප්තියේ අංක 6(ආ) 6(ඉ) වගන්ති ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව 2015.12.04 දිනැති *අතිවිශෙෂ ගැසට්* අංක 1943/23 දරන *ගැසට්* නිවේදනය මගින් පත් කරන ලද පහත නම සඳහන් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයා එම ප්‍රඥප්තියේම 13 වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල අනුව මධ්‍යම පළාත් සභාවේ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරියේ සභාපති/අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකත්වයෙන් ඉවත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරමි.

එදිරිවීර වීරවර්ධන,
මාර්ග සංවර්ධන, ප්‍රවාහන, විදුලිබල හා
බලශක්ති සහ නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය,
මධ්‍යම පළාත.

2017 සැප්තැම්බර් මස 25 වැනි දින.

| *නම* | *ලිපිනය* | *තනතුර* | *ක්‍රියාත්මක දිනය* |
|---|---|---|---|
| එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා | අංක 77, මාපාමඩුල්ල, කටුගස්තොට. | සභාපති (සාමාජික) | 2017.09.25 |

10-383/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.